ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා අධ්‍යයන පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව - 6 මට්ටම
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය II - 2022/2023
**LLU6716/LWU4324 – වාණිජ්‍ය නීතිය**
කාලය - පැය 1

---

දිනය : 2023 දෙසැම්බර් 4 | වේලාව: ප.ව 1.30 - ප.ව 2.30

---

**අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.**
**මුළු ප්‍රශ්න ගණන - 02**
**එක්(01) ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.**

1. ගෘහණියක වන දිල්හාරා ඇගේ දේපළෙහි මායිම වූ එක් බිත්තියක් ඇගේ අසල්වැසියා සතු වූ එළවළු වගාවට ඉතා ආසන්නව තිබීම නිසා නිතරම තෙතමනයෙන් යුක්ත බවට දුටුවාය. ඇය "රෝහණ තීන්ත අළෙවිසැලට" ගොස් ඇය මුහුණ දෙමින් සිටින ගැටලුව පැහැදිලි කළ අතර දියසීරාව නතර කිරීම සඳහා කුමන තීන්ත වර්ගයක් භාවිත කළ යුතුද යන්න පිළිබඳව රෝහණගේ උපදෙස් විමසන ලදී. දිල්හාරා ඇගේ බිත්තියේ නිර්දේශිත තීන්ත ආලේප කළද, දියසීරාව නතර නොවුණු අතර අදාළ තීන්ත දියසීරාව වළක්වන තීන්ත නොවන බවත් අභ්‍යන්තරව ආලේප කරන සාමාන්‍ය තීන්ත වර්ගයක් බව ඇය අනාවරණය කර ගත්තාය.

(අ). ඉහත විකිණීම මගින් උද්ගත වන්නා වූ නෛතික ප්‍රතිවිපාකයන් සාකච්ඡා කරන්න. 1896 අංක 11 දරණ භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ ප්‍රතිපාදනයන් සහ නඩු තීන්දු ඇසුරින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

**(ලකුණු 8)**

(ආ). ඉහත (අ) කොටස සඳහා ඔබ ලබා දුන් පිළිතුර පහත අවස්ථාවන්හිදී වෙනස් වන්නේද:

I. දිල්හාරා ඇයට තීන්ත අවශ්‍ය වීමේ හේතුව සඳහන් නොකිරීම.

**(ලකුණු 6)**

II. රෝහණ දිල්හාරාට විකුණූ තීන්ත ගාමිණීගෙන් ලබා ගෙන ඇත්තේ, 'රොහාන්ගේ තීන්ත අලෙවි සැල' නම් වූ එම පාරේම පිහිටි විශාල තීන්ත වෙළඳ සැලේ අයිතිකරු ලෙස පෙනී සිටිමින් වීම **(ලකුණු 6)**

2. "කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ කුලී ගැණුම්කරුගේ සහ අයිතිකරුගේ අයිතීන් සංසන්දනය කරන විට පෙනී යන්නේ එවැනි ගිවිසුම් කුලී ගැණුම්කරුට වඩා අයිතිකරුවන්ට වඩාත් වාසිදායක බවයි."

ඔබ ඉහත ප්‍රකාශය සමග එකග වන්නේද?

1982 අංක 29 දරණ පාරිභෝගික ණය පනතේ ප්‍රතිපාදනයන් සහ නඩු තීන්දු ඇසුරින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

**(ලකුණු 20)**

---හිමිකම් ඇවිරිණි---